# මීගමුව මහා නගර සභාව

## 2025 නත්තල් උත්සවය හා 2026 නව අවුරුදු උදාව වෙනුවෙන් මීගමුව මහා නගර සභා ගොඩනැගිල්ල හා ඒ අවට ගස්, මීගමුව නගරයේ ඔරලෝසු කණුව හා ඔරලෝසු කණුව අසල සිට දිශා හතරට මාර්ග මීටර් 100 බැගින් විවිධ වර්ණ LED විදුලි බුබුළු යොදා අලංකාර කිරීම සඳහා මිල ගණන් ලබා ගැනීම .

2025 නත්තල් උත්සවය හා 2026 නව අවුරුදු උත්සවය වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ල හා ඒ අවට ගස්, මීගමුව නගරයේ ඔරලෝසු කණුව හා ඔරලෝසු කණුව අසල සිට දිශා හතරට මාර්ග මීටර් 100 බැගින් විවිධ වර්ණ LED විදුලි බල්බ යොදා 2025.12.24 සිට 2026.01.02 දක්වා කාලය තුල ආලෝක කිරීම සිදු කළ යුතුව ඇත. ඒ සඳහා LED බල්බ 90,000 ක් ඇතුළු අදාල සියළු උපාංග සහ අවශ්‍ය විදුලි බලය ඔබ විසින් සපයා ගත යුතුය.

මේ සඳහා වන ඔබගේ මිල ගණන් පිටපත් දෙකකින් යුක්තව සකසා 2025.12.17 දින ප.ව. 02.00 ට පෙර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ප්‍රාදේශීය මිල ගණන් පෙට්ටියේ බහාලිය හැකි බව කාරුණිකව දන්වා සිටිමි. ඔබගේ මිල ගණන් බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "නත්තල් විදුලි සැරසිලි සඳහා මිල ගණන් 2025" යනුවෙන් සටහන් කර එවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

මෙම මිල ගණන් පිලිබඳ අවසන් තීරණය මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. දන්වා ඇති උපදෙස්වලට අනුකූලව ඉදිරිපත් නොකරන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රාදේශීය මිල ගණන් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ටෙන්ඩර්කරුගේ ලිඛිත අවසරය ලත් නියෝජිතයෙකුට පමණක් පෙනී සිටිය හැක. වැඩි විස්තර නාගරික ඉංජිනේරු වෙතින් කාර්යාල වේලාවන් තුලදී පහත දුරකථන අංකය අමතා දැනගත හැක.

දුරකථන අංකය : 031 – 2233190

**01.** මීගමුව මහා නගර සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඒ අවට ගස්, මීගමුව නගරයේ ඔරලෝසු කණුව හා ඔරලෝසු කණුව අසල සිට දිශා හතරට මාර්ග මිටර් 100 බැගින් විවිධ වර්ණ LED විදුලි බුබුළු යොදා අලංකාර කිරීම.

2025.12.12 දින මීගමුව මහා නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේදී.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.